වාර්ෂික වාර්තාව 2019

ආචාර්ය සුමිල තරංගා වානගුරු
අතිරේක අධ්‍යක්ෂ
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 මැයි

ව්‍යවස්ථානුකූල අවශ්‍යතාව

මුදල් නීති පනතේ 35 වන වගන්තිය අනුව:

… සෑම මූල්‍ය වර්ෂයක් අවසාන වීමෙන් පසුව මාස හතරක් ඇතුළත මහ බැංකුවේ තත්ත්වය සහ මූල්‍ය වර්ෂය තුළ මුදල් මණ්ඩලය මගින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළෙහි සමාලෝචනයක් සහ මෙම ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ සඳහා පාදක වූ ආර්ථික හා මූල්‍ය තත්ත්වයන්ගේ විශ්ලේෂණයකින් යුතු වාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම හා මුදල් විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම මුදල් මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ…

2019 වර්ෂය සඳහා වන මෙම වාර්තාව
ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි හැත්තෑ වන වාර්ෂික වාර්තාවයි

වාර්ෂික වාර්තාවේ පෙළගැස්ම

I වන වෙළුම - ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ගැටලු සහ ප්‍රතිපත්ති

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

II වන වෙළුම - ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

- මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළව රජය සහ මුදල් මණ්ඩලය විසින් වසර තුළදී ක්‍රියාත්මක කරනු ලැබූ පරිපාලන ක්‍රියාමාර්ග

- මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළව 2019 වසරේදී සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත්

ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ගැටලු සහ ප්‍රතිපත්ති

1. ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති
2. ජාතික නිෂ්පාදිතය, වියදම සහ ආදායම
3. ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්
4. මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව
5. විදේශීය අංශයේ ප්‍රවණතා හා ප්‍රතිපත්ති
6. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු
7. මුදල් ප්‍රතිපත්තිය, මුදල්, ණය සහ පොලී අනුපාතික
8. මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව

1 වන පරිච්ඡේදය

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති



2019 වසරේ දී ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රවණතා

සාර්ව ආර්ථික ස්ථායීකරණ ක්‍රියාමාර්ග

උද්ධමනය

විදේශීය අංශයේ ශක්තිමත් ස්ථාවරත්වය

- වෙළඳ සහ ජංගම ගිණුම්වල හිගයන් අඩු වීම
- ස්ථාවර විනිමය අනුපාතිකය
- ඉහළ සංචිත මට්ටම

රාජ්‍ය මූල්‍ය ඉලක්කවලින් බැහැර වීම



අයවැය හිඟය (ද.දේ නි.යෙහි % ක් ලෙස)

අඩු ආර්ථික වර්ධනය



පාස්කු ප්‍රහාර

වර්ධනය තවදුරටත් අඩුවිය



ව්‍යාපාර විශ්වාසය ↓

ඉල්ලුම අඩු විය

කාලගුණික විපර්යාස හේතුවෙන් කෙටිකාලීන ඉහළ යෑම් වාර්තා වුවද



මූල්‍ය අංශයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය

පෞද්ගලික අංශයේ ණය වර්ධනය ↓



පෞද්ගලික අංශයේ ණය වර්ධනය (වාර්ෂික පදනම මත, %)

ගෝලීය වර්ධනයන් ද දේශීය ආර්ථිකයට සැලකිය යුතු බලපෑම් ඇති කළේය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති ස්ථාවරය

නියාමන ක්‍රියාමාර්ග ආධාරයෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතුවලට සහාය වීම

2020 වර්ෂය ආරම්භයේදී ආර්ථිකය පුනර්ජීවනය කිරීම සහ ව්‍යාපාරික විශ්වාසය වැඩිදියුණු කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලට දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ඉක්මනින්ප්‍රතිචාර දක්වන බව දක්නට ලැබුණි.



පාලනය කිරීමේ පියවර

ගෝලීය ආර්ථිකයේ පුරෝකථනය කළ පසුබෑම

කෙටි කාලීනව ශ්‍රී ලංකාව <u>දැඩි</u> බලපෑමකට ලක්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- ද. දේ. නි. යෙහි වර්ධනය
- රාජ්‍ය මූල්‍ය අංශය
- විදේශීය අංශය
- මූල්‍ය අංශය

බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයින් මත ඇති වන පීඩනය ලිහිල් කිරීමට රජය ගන්නා උත්සාහයන්ට සහාය වීමට තමන් සතුව ඇති අවකාශ ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය...

මුදල් ප්‍රතිපත්ති අවකාශය

අඩු උද්ධමනය

බැංකු අංශයේ අවකාශය

ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා ආරක්ෂක පවත්වා ගැනීම

වසංගතයෙන් තාවකාලික පසුබෑමක් පැවතියද, ආර්ථික වර්ධනය ඇති කෙරෙන සුදුසු ප්‍රතිසංස්කරණ නිසි කලට ක්‍රියාත්මක කිරීම...

- දීර්ඝ කාලීන ව්‍යුහාත්මක ගැටලු විසඳීම සහ දේශීය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම
- අපනයන දිශානතිය වැඩි දියුණු කිරීම
- විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය
- නවෝත්පාදන සඳහා පහසුකම් සැපයීම
- නිෂ්පාදන සාධකවල ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම
- ප්‍රතිපත්ති ආරක්ෂක වැඩි දියුණු කිරීම

ශ්‍රී ලංකාවේ තිරසාර හා සමානාත්මතාවයෙන්යුතු ආර්ථික වර්ධනයක් ඇති කිරීම

2 වන පරිච්ඡේදය

ජාතික නිෂ්පාදිතය, වියදම
සහ ආදායම

3 වන පරිච්ඡේදය

ආර්ථික සහ සමාජ යටිතල
පහසුකම්

4 වන පරිච්ඡේදය

මිල, වැටුප්, සේවා නියුක්තිය
සහ ඵලදායිතාව



2019 වසරේ දී ආර්ථික වර්ධන වේගය මන්දගාමී වූ අතර, ආර්ථිකය මූර්ත වශයෙන් 2.3%කින් වර්ධනය විය...

- **ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශ 2019 වසරේ දී ධනාත්මක නමුත්, මන්දගාමී වර්ධන වේගයන් වාර්තා කළේය.**
  - දැඩි අහිතකර කාලගුණික තත්ත්ව මගින්, විශේෂයෙන් තේ, රබර්, මුහුදු මත්ස්‍ය හා ජලජීවී වගා අංශ ඇතුළත් **කෘෂිකාර්මික අංශයට** බලපෑම් ඇති විය
  - ඉදිකිරීම් හා පතල් කැණීම් කටයුතුවල ඇති වූ පිබිදීමේ සහයෝගය ද ඇතිව **කර්මාන්ත අංශය** 2.7%කින් වර්ධනය විය.
  - නවාතැන්, ආහාර පාන සේවා ක්‍රියාකාරකම්වල අඩු වීම සහ තොග හා සිල්ලර වෙළඳාම මන්දගාමී වීම හේතුවෙන් **සේවා අංශයේ** වර්ධනය 2.3%ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි.

වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් ලෙස වර්ගීකරණය කරන ලදි...

- **කෙසේ වෙතත්, ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය, 2018 වසරේ දී වූ එ.ජ. ඩොලර් 4,079ක සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් 3,852ක් දක්වා පහත වැටී ඇත. එයට හේතු:**
  - අඩු ආර්ථික වර්ධන වේගය
  - රුපියලේ, වාර්ෂික සාමාන්‍යය ලෙස අවප්‍රමාණය වීම

ඒක පුද්ගල ද.දේ.නි. (අ)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු සහ නවතම ජනගහන දත්ත මත පදනම් වේ.

පරිභෝජන වියදම් සහ ශුද්ධ විදේශීය ඉල්ලුම වැඩි දියුණු වීම ආර්ථික වර්ධනයට සහාය විය...

- **දළ දේශීය නිෂ්පාදිතයේ වියදම් ප්‍රවේශය අනුව, 2019 දී**
- පරිභෝජන වියදම් (ද.දේ.නි.යෙන් 78.7%) 6.9%ක වර්ධනයක් වාර්තා කළේය
- ආයෝජන 5.9%ක පහළ යාමක් වාර්තා කරමින් තවදුරටත් පහත වැටුණි
- ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, ආයෝජන, 2018 දී වාර්තා වූ 30.4%ක සිට 27.4%ක් දක්වා අඩු විය
- **ආනයනවල තියුණු පහත වැටීමක් සමඟ වෙළඳ ශේෂයේ වර්ධනයක් වාර්තා වුව ද ශුද්ධ විදේශීය ඉල්ලුම අඛණ්ඩව සෘණ අගයක පැවතුණි.**

- **ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, දේශීය ඉතිරිකිරීම්, 2018 වසරේ දී වාර්තා වූ 23.0%ක සිට 2019 වසරේ දී 21.3%ක් දක්වා අඩු විය**
- **නමුත් ආයෝජන වියදම්වල සැලකියයුතු පහළයෑම හේතුවෙන්,**
- **ද.දේ.නි.යෙහි** ප්‍රතිශතයක් ලෙස, දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය, 2018 වසරේ දී වාර්තා වූ 7.4%ක සිට 2019 වසරේ දී 6.1%ක් දක්වා අඩු විය
- **ද.දේ.නි.යෙහි** ප්‍රතිශතයක් ලෙස, ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2018 වසරේ දී වාර්තා වූ 3.1%ක සිට 2019 වසරේ දී 2.1%ක් දක්වා අඩු විය

ඉතුරුම්, ආයෝජන හා ඉතුරුම් - ආයෝජන පරතරය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ආර්ථික ක්‍රියාකාරකම්හි පහළ යෑම පිළිබිඹු කෙරෙමින්, 2018 වසරේ දී 4.4%ක් වූ සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ දී 4.8%ක් දක්වා ඉහළ ගියේය...

- ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ ඉහළම ස්ත්‍රී පුරුෂ පරතරයක් ඇති රටවල් 20 අතර ශ්‍රී ලංකාව රැඳී සිටී
- තරුණ, කාන්තා හා අධ්‍යාපන සුදුසුකම් ලත් කාණ්ඩ අතර විරැකියාව අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි.

ශ්‍රම වෙළඳපොළ - 2019 (අ)



(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

සේවා වියුක්ති අනුපාතිකය



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දැඩි රාජ්‍ය මූල්‍ය සීමා පැවතිය ද 2019 වසරේ දී රටේ ආර්ථික යටිතල පහසුකම් පුළුල් කිරීමේ කටයුතුවල රජය නිරත විය...

- දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය සහ පිටත වටරවුම් මහා මාර්ග ව්‍යාපෘතියේ iii අදියරෙහි වැඩ අවසන් කරන ලදී.

- උමා ඔය ව්‍යාපෘතිය යටතේ ජලාශ හතරක් 2019 ඔක්තෝබර් මාසයේ දී මහ ජනතාව සඳහා විවෘත කරන ලදී.

- 2019 ජනවාරි මාසයේ දී වරාය නගර ව්‍යාපෘතිය යටතේ ඉඩම් ගොඩ කිරීමේ කටයුතු අවසන් විය.

- ව්‍යාපෘතිය යටතේ ගොඩ කරන ලද ඉඩම් කොළඹ දිස්ත්‍රික්කයේ කොටසක් සහ නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ පවතින නාගරික සංවර්ධන කලාපයක් ලෙසත් ප්‍රකාශයට පත් කරන ලදී.

යටිතල පහසුකම් සඳහා වූ රාජ්‍ය ආයෝජන

වර්ෂය	ආර්ථික සේවා		සමාජ සේවා		එකතුව	
	රු. බිලියන	ද.දේ.නි. % ලෙස	රු. බිලියන	ද.දේ.නි. % ලෙස	රු. බිලියන	ද.දේ.නි. % ලෙස
2015	429.0	3.9	124.4	1.1	553.4	5.1
2016	424.0	3.5	117.3	1.0	541.3	4.5
2017 (අ)	474.1	3.6	135.4	1.0	609.5	4.6
2018 (අ)	437.9	3.3	133.2	1.0	571.1	4.3
2019 (ආ)	475.9	3.4	112.9	0.8	588.8	4.1

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ යන බලශක්ති ඉල්ලුම සැපිරීමේ දී රටට අභියෝගවලට මුහුණ දීමට සිදු විය ...

- විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 15,879ක් දක්වා සියයට 3.3කින් වර්ධනය විය.
- විදුලිබල අලෙවිය ගි.වො.පැ. 14,612ක් දක්වා සියයට 3.7කින් වර්ධනය විය.
- වියළි කාලගුණික තත්ත්ව හේතුවෙන් ජල විදුලිබල උත්පාදනය අඩු වුව ද, ඉහළ යන විදුලිබල ඉල්ලුම දැවි තෙල් සහ ගල් අඟුරු බල උත්පාදනයෙන් සපුරා ගන්නා ලදී.
- ලං.වි.ම. 2019 මාර්තු සහ අප්‍රේල් මුල් භාගයේ දී සැලසුම් සහගත විදුලිබල කප්පාදුවකට යොමු විය.

විදුලිබල උත්පාදන සංයුතිය





ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල හා ලං.ඛ.නි.සං. විසින් ආනයනය කරන ලද බොරතෙල් මිල



- බ්‍රෙන්ට් බැරලයක සාමාන්‍ය මිල 2018 වසරේ පැවති එ.ජ. ඩොලර් 71.76 සිට 2019 වසරේ දී බැරලයකට එ.ජ. ඩොලර් 64.04ක් දක්වා සියයට 10.7කින් පහත වැටුණි.
- ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් 2019 සැප්තැම්බර් දක්වා ක්‍රමානුකූලව සංශෝධනය කෙරුණි.
- දැවි තෙල් පාදක කරගත් බලශක්ති උත්පාදනය ඉහල යෑම සහ ප්‍රවාහන අංශයේ ඇති වූ ඉහළ ඉල්ලුම හමුවේ 2019 වසරේ දී දේශීය වෙළඳපොලේ ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය සියයට 4.8කින් වර්ධනය විය.
- කොවිඩ්-19 වසංගතය හමුවේ 2020 ජනවාරි මස තෙවන සතියේ සිට තෙල් මිල ගණන් සැලකිය යුතු පහළ යාමක් පෙන්නුම් කළේය.

විදුලි සංදේශ අංශය 2019 වසරේ දී පුළුල් වූ අතර ජල සැපයුම සඳහා වූ ප්‍රවේශය ඉහළ නැංවීමට රජය විසින් ප්‍රයත්න දරන ලදී...

දුරකථන ඝනත්වය



මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- දුරකථන ඝනත්වය:
  - පුද්ගලයන් සියයකට සම්බන්ධතා 161.4ක්
- අන්තර්ජාල ඝනත්වය:
  - පුද්ගලයන් සියයකට සම්බන්ධතා 61.5ක්

ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය
- 91.9% (2019)
නල ජලය සඳහා ප්‍රවේශය
– 51.8% (2019)

පාස්කු ඉරු දින ප්‍රහාර නිසා දේශීය ප්‍රවාහන ක්‍රියාකාරකම් පසුබෑමකට ලක් වූව ද, වරාය මෙහෙයුම් කටයුතුවල වර්ධනයක් වාර්තා විය ...







පාස්කු ඉරු දින ප්‍රහාරවලින් පසුව ආරක්ෂිත හේතු මත පුද්ගල ගමනාගමනය අඩු වීම සහ ආර්ථික කටයුතුවල පහත වැටීම හමුවේ 2019 වසරේ දී මහා මාර්ග, දුම්රිය මාර්ග සහ ගුවන් මගින් සිදු කරන ලද මගී සහ භාණ්ඩ ප්‍රවාහනය යන දෙඅංශයේ ම පසුබෑමක් ඇති විය

බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්



මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

මෙහෙයවන ලද සමස්ත භාණ්ඩ ප්‍රමාණය -

මෙ.ටො. මිලියන 106.98ක් දක්වා සියයට 1.9කින් වර්ධනය විය

බහලු මෙහෙයුම් ප්‍රමාණය-

අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 7.2ක් දක්වා සියයට 2.6කින් වර්ධනය විය

බහලු ප්‍රති නැව්ගත කිරීම් ප්‍රමාණය-

අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 5.96ක් දක්වා සියයට 4.4කින් වර්ධනය විය

ශ්‍රී.ලං.ව.අ. අඛණ්ඩව දෙවන වරටත් ගෝලීය වරාය සමුළුවේ දී 2019 වසරේ වරාය අධිකාරිය ලෙස සම්මාන ලැබිය

කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය අඛණ්ඩව තෙවන වරටත් අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 4 කාණ්ඩය යටතේ ආසියාවේ හොඳම බහලු පර්යන්තය ලෙස තේරුණි

අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා රජය අඛණ්ඩව ක්‍රියා කළේය ...

- අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් ලබා දීම වැඩිදියුණු කිරීම හා රැකියා වෙළඳපොළේ වෙනස්වන නිපුණතා ඉල්ලුම සපුරාලීම පිණිස 'වසර 13 ක සහතික කළ අධ්‍යාපනය' සහ ‘ළඟම පාසල හොඳම පාසල’ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක විය.

- 2019 ජුනි මාසයේ දී උසස් අධ්‍යාපන (තත්ත්ව සහතික හා ප්‍රතීතන කොමිෂන් සභා) පනත් කෙටුම්පත ගැසට් කරන ලද අතර අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් හා නිරීක්ෂණ සඳහා ද එය යොමු කරන ලදී.

- වසර 13 ක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ රාජ්‍ය අංශයේ තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාල විසින් පිරිනමනු ලබන ග්‍රැෆික් සැලසුම් කිරීම, ඉදිකිරීම, වෙබ් සැලසුම් කිරීම, මෝටර් රථ හා විදුලි පාඨමාලා සඳහා සිසුන් 798 දෙනෙකු බඳවා ගන්නා ලදී.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ශ්‍රී ලංකාව;
- මවගෙන් දරුවාට මානව ප්‍රතිශක්ති ඌණතා වෛරසය (HIV) සහ සිෆිලිස් සම්ප්‍රේෂණය නොවන
- දේශීයව බෝවන සරම්ප තුරන් කරන ලද සහ රුබෙල්ලා පාලනය කර ඇති රටක් බව ප්‍රකාශයට පත් කළේය.

- ඩෙංගු, මී උණ සහ ඉන්ෆ්ලුවෙන්සා වැනි බෝවන රෝගවලින් ශ්‍රී ලංකාව තවමත් පීඩාවට ලක් වී ඇත.
- කොවිඩ්-19 වසංගතය 2020 දී ශ්‍රී ලංකාව තුළ බරපතල සෞඛ්‍ය ගැටලු ඇති කර ඇති අතර එය සමාජ ආර්ථික සාධක කෙරෙහි ද සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත.
- උග්‍ර හා නිදන්ගත බෝනොවන රෝග පාලනය කිරීම සඳහා රජය විවිධ ආකාරයේ අවදානම් අවම කිරීමේ වැඩසටහන්, පරීක්ෂණ සහ සෞඛ්‍ය අධ්‍යාපන සහ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය.



දරිද්‍රතාවය තුරන් කිරීමේ අරමුණින් රජය විසින් සමාජ සුභසාධන වැඩසටහන් අඛණ්ඩව ව්‍යාප්ත කරන ලදී.....

ජනගහන දරිද්‍රතා දර්ශකය (%)

අංශය	2002	2006/07	2009/10	2012/13	2016
ශ්‍රී ලංකාව	**22.7**	**15.2**	**8.9**	**6.7**	**4.1**
නාගරික	7.9	6.7	5.3	2.1	1.9
ග්‍රාමීය	24.7	15.7	9.4	7.6	4.3
වතු	30.0	32.0	11.4	10.9	8.8

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- ජනගහන දරිද්‍රතා දර්ශකය ක්‍රමයෙන් පහළ යමින් පැවතියද, විශාල පිරිසක් දරිද්‍රතා රේඛාවට මදක් ඉහළින් ජීවත් වෙති.
- 2019 අගෝස්තු මාසයේ දී පවුල් 433,594කට අලුතින් සමෘද්ධි ප්‍රතිලාභ ලබා දෙන ලදී.
- ඒ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත ගෘහ ඒකකවලින් ආසන්න වශයෙන් සියයට 33ක් පමණ සමෘද්ධි ප්‍රතිලාභ ලබති.

ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම

වර්ෂය	දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන		පෝෂණ දීමනා වැඩසටහන		වියළි සලාක වැඩසටහන
	පවුල් සංඛ්‍යාව (අ)	වටිනාකම (රු. මිලියන) (ආ)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (අ)	වටිනාකම (රු. මිලියන)	වටිනාකම (රු. මිලියන)
2015	1,453,078	39,994	101,200	2,422	118
2016	1,407,235	40,740	337,554	5,746	111
2017	1,388,242	39,707	372,407	5,408	84
2018	1,384,021	39,239	329,047	5,490	58
2019	1,800,182	44,660	300,246	5,279	105

(අ) වසර අවසානයේ දී
(ආ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

2019 වසර තුළ දී උද්ධමනය සමස්තයක් ලෙස අඩු මට්ටමක පැවතුන ද, 2019 වසර අවසානය වනවිට සැපයුම් සාධක හේතු කරගෙන එහි ඉහළ යෑමක් නිරීක්ෂණය විය...

- මතුපිට උද්ධමනය 2019 වසර තුළ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය.
- කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත), 2018 වසර අවසානය වන විට පැවති සියයට 2.8 සිට 2019 වසර අවසන් වන විට සියයට 4.8ක් දක්වා ඉහළ ගිය අතර, ජා.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත), 2017 වසරේ සිට පැවති ඉහළම අගය වාර්තා කරමින්, 2018 වසරේ පැවති සියයට 0.4 සිට 2019 වසර අවසන් වන විට සියයට 6.2ක් දක්වා ඉහළ ගියේය.
- ප්‍රධාන වශයෙන් නිවාස කුලී වැඩිවීම හේතුවෙන් 2019 ජනවාරි මාසයේ දී මූලික උද්ධමනය ඉහළ ගිය අතර, ඉන් අනතුරුව එය බොහෝ දුරට තනි මැදි අගය පරාසයක පැවතුණි.

මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

- මතුපිට උද්ධමනයේ ප්‍රවණතාවලට සමගාමීව 2019 වසරේ දී ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා බොහෝ දුරට තනි මැදි අගය මට්ටමට වඩා පහළ මට්ටමක පැවතුණි.
- සාමාන්‍ය මිල මට්ටම මත වැටුප් නිසා ඇති වන ඉල්ලුමේ පීඩනය 2019 වසරේ දී අඩු අගයක් විය.

5 වන පරිච්ඡේදය

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති



අපනයන මගින් ලද ආදායම 2019 වසරේ දී සුළු වශයෙන් වුවද අඛණ්ඩව වර්ධනය විය....



- **අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 11,940ක් දක්වා 0.4%කින් ඉහළ ගියේය**
  - කාර්මික අපනයන ආදායම ඉහළ ගිය අතර කෘෂි කාර්මික සහ ඛනිජ අපනයන ආදායම පහත වැටුණි.
- **අපනයන ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ :**
  - රෙදිපිළි හා ඇඟලුම් (5.2%)
  - මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ (10.0%)
  - ප්‍රවාහන උපකරණ (21.3%)
  - සත්ත්ව ආහාර (19.7%)
  - පොල් (6.0%)
- **අපනයන පහළ යෑම් වාර්තා වූයේ :**
  - තේ (-5.7%)
  - කුළුබඩු (-13.2%)
  - ඛනිජ තෙල් නිෂ්පාදිත (-16.2%)
  - සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් (-30.3%)

- **ඇමරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ප්‍රධානතම ගැනුම්කරුවා (26%) වූ අතර ඉන් අනතුරුව එක්සත් රාජධානිය (8%) සහ ඉන්දියාව (6%) පැවතුණි.**

අපනයන සංයුතිය- 2019



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන වෙළඳ දිශාව



මූලයඃ ශ්‍රී ලංකා රේගුව

ප්‍රධාන වශයෙන් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2019 වසරේ දී ආනයන වියදම සැකිය යුතු අඩුවීමක් වාර්තා කළේය ...



- **ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 19,937ක් දක්වා 10.3%කින් පහළ ගියේය:**
  - සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පහළ ගියේය.
- **ආනයන අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ:**
  - පෞද්ගලික රථවාහන (-48.2%)
  - ඉන්ධන (-6.3%)
  - සහල් (-88.0%)
  - රත්‍රන් (-99.4%)
  - මූල ලෝහ (-17.6%)
- **ආනයන ඉහළ යෑම් වාර්තා වූයේ :**
  - රෙදිපිළි හා රෙදිපිළි උපාංග (1.8%)
  - බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (3.9%)
  - ඛනිජ නිෂ්පාදිත (34.1%)
- **චීනය සහ ඉන්දියාව (20%) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව වූ අතර ඉන් අනතුරුව එක්සත් අරාබි එමීර් රාජ්‍ය (8%) පැවතුණි.**

ආනයන සංයුතිය- 2019



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන වෙළඳ දිශාව



මූලය: ශ්‍රී ලංකා රේගුව

පසුගිය වසර පහ තුළදී අඛණ්ඩව පුළුල් වූ වෙළඳ හිඟය 2019 වසරේදී සැලකිය යුතු ලෙස අඩු විය...

- වෙළඳ හිඟය 2018 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,343 සිට 2019 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,997 දක්වා **එ.ජ. ඩොලර් මිලියන 2,346කින් අඩු විය.**
- **ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස** වෙළඳ හිඟය 2018 වසරේ දී වාර්තා වූ 11.7% සිට 2019 වසරේ දී 9.5%ක් **දක්වා පහත වැටුණි**
- 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී අපනයන මිල දර්ශකය (-6.3% කින්) සහ ආනයන මිල දර්ශකය (-4.8%කින්) යන දෙකම පහත වැටීම හේතුවෙන් 2019 වසරේ **දී වෙළඳ මිල අනුපාතය 1.6%කින් පහත වැටුණි.**

Exports, Imports and Trade Deficit (USD bn)



Terms of Trade and Trade Indices



පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලින් පසුව කැපී පෙනෙන ලෙස පහත වැටුණු සංචාරක ඉපැයීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය...

- 2019 වසරේ පළමු කාර්තුවේ දී සංචාරක පැමිණීම් කාර්තුවක් සඳහා වූ ඉහළම සංඛ්‍යාව වාර්තා කරන ලදී.
- කෙසේ වුවද, **පාස්කු ඉරු දින සිදු වූ ප්‍රහාරවලට** පසු 2019 වසරේ අප්‍රේල් මාසයේ අග භාගයේ සිට සංචාරක පැමිණීම් කැපී පෙනෙන ලෙස පහත වැටුණි.
- මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ දී **සංචාරක පැමිණීම්** සංඛ්‍යාව 18.0%කින් පහත වැටුණි.
  - **2019: 1,913,702**
  - 2018: 2,333,796
- **සංචාරක ඉපැයීම්** ප්‍රමාණයද එ.ජ. ඩොලර් බිලියන 3.6ක් දක්වා 17.7%කින් පහත වැටුණි.
- රටේ ආරක්ෂක තත්ත්වය ඉහළ නැංවීම, ව්‍යාපාර සඳහා මූල්‍යමය සහාය ලබාදීම හා සංචාරක ප්‍රවර්ධනය සිදු කරන අතරම ගනු ලැබූ **කඩිනම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග** හේතුවෙන් 2019 වසරේ අග භාගය වන විට **සංචාරක පැමිණීම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්විය.**
- කෙසේ වුවද, **කොවිඩ්-19** වසංගත තත්ත්වය හේතුවෙන් වර්තමානය වන විට සංචාරක පැමිණීම් නැවතී ඇත.

Monthly Tourist Arrivals - 2019



Tourist Arrivals and Earnings from Tourism



මූලයː ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2019 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඩු වූ අතර, ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය බොහෝදුරට නොවෙනස්ව පැවතුණි...

- **2019 වසරේ දී සේවා ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 2,849ක් දක්වා අඩු විය.**
  (2018: එ.ජ.ඩොලර් මිලියන 3,766)

2019 වසරේ දී සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස අඩු වූ අතර ප්‍රවාහන සේවා සුළු වශයෙන් අඩු විය:

- සංචාරක ඉපැයීම්: **17.7%කින් අඩු විය.**
- 2019 වසරේ දී ප්‍රවාහන සේවා ලැබීම් **එ.ජ.ඩොලර් මිලියන 2,339ක්** විය. (2018: එ.ජ.ඩොලර් මිලියන 2,486)
- 2019 වසරේදී පරිගණක සේවා අංශය (තොරතුරු තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම) හිතකර මට්ටමකින් අඛණ්ඩව වර්ධනය වූ අතර **එ.ජ.ඩොලර් මිලියන 899ක** අගයක් ගනු ලැබීය.
  (2018: එ.ජ.ඩොලර් මිලියන 848)

- **2019 වසරේදී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය එ.ජ.ඩොලර් මිලියන 2,426ක් දක්වා සුළු වශයෙන් වැඩි විය.**
  (2018: එ.ජ.ඩොලර් මිලියන 2,385)

ප්‍රාථමික ආදායම් ගිණුම වෙතින් වූ ගෙවීම් ප්‍රධාන වශයෙන් වැඩිවීමට හේතු වූයේ:

- සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් ඉහළ යෑම
- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා කූපන ගෙවීම් ඉහළ යෑම

කෙසේවෙතත්, 2018 හා සැසඳීමේදී ණය සහ ණය සුරැකුම්පත් සඳහා වූ පොලී ගෙවීම් පමණක් සුළු වශයෙන් වැඩි විය.

- **විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ද අඩු විය.**

මැද පෙරදිග කලාපයේ භූ-දේශපාලනික ප්‍රවණතාවල බලපෑම හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ **එ.ජ.ඩොලර් මිලියන 6,717ක්** දක්වා **4.3%කින්** අඩු විය (2018: එ.ජ.ඩොලර් මිලියන 7,015)

සමස්තයක් වශයෙන්, වෙළෙඳ හිඟයෙහි සැලකිය යුතු අඩු වීමත් සමග 2019 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය කැපී පෙනෙන ලෙස අඩු විය ...

2019 වසරේ ජංගම ගිණුමෙහි සංයුතිය :

- **වෙළඳ හිඟය : එ.ජ. ඩොලර් මිලියන 7,997**
  (2018: එ.ජ. ඩොලර් මිලියන 10,343)

- **සේවා ගිණුමෙහි අතිරික්තය : එ.ජ. ඩොලර් මිලියන 2,849**
  (2018: එ.ජ. ඩොලර් මිලියන 3,766)

- **ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය : එ.ජ. ඩොලර් මිලියන 2,426**
  (2018: එ.ජ. ඩොලර් මිලියන 2,385)

- **ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය: එ.ජ. ඩොලර් මිලියන 5,766**
  (2018: එ.ජ. ඩොලර් මිලියන 6,163)

වෙළෙඳ ශේෂය

වෙළෙඳ ශේෂය, ජංගම ගිණුමේ ශේෂය සහ සමස්ත ශේෂය



ජංගම ගිණුමේ ශේෂය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් වීමට ඉඩ ඇත...

2019 වසරේ දී රජය විසින් සැළකිය යුතු ප්‍රමාණයක ණය ආපසු ගෙවීම් සිදු කිරීම මධ්‍යයේ වුවද, ඉහළ ලැබීම් ප්‍රමාණයක් සමගින් මූල්‍ය ගිණුම වර්ධනය විය...

2019 වසරේදී මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම්:

- එ.ජ. ඩොලර් බිලියන 4.4ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙක
- රජය වෙත වූ එ.ජ. ඩොලර් බිලියන 1.6ක ණය ලැබීම්
- එ.ජ. ඩොලර් බිලියන 1.2ක විදේශීය සෘජු ආයෝජන (ආයෝජන මණ්ඩලයේ සමාගම් වෙත වූ ණය ඇතුළුව)
- ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි හයවන සහ හත්වන වාරික ලෙස ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 327

මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් සහ ගෙවීම්



2019 වසරේදී මූල්‍ය ගිණුම වෙතින් වූ ප්‍රධාන ගෙවීම්:

- එ.ජ. ඩොලර් බිලියන 1.7ක රජයේ ණය ආපසු ගෙවීම්
- එ.ජ. ඩොලර් බිලියන 1.5ක කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක ආපසු ගෙවීම්
- එ.ජ. ඩොලර් මිලියන 333ක රාජ්‍ය සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර) (ශුද්ධ)
- ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් නිකුත් කර, කල්පිරුණු ජාත්‍යන්තර බැඳුම්කරයෙහි එ.ජ. ඩොලර් මිලියන 250ක ආපසු ගෙවීම්)

මූල්‍ය ගිණුම (ශුද්ධ)



2019 අවසානය වනවිට ගෙවුම් තුලනය සමස්ත අතිරික්තයක් වාර්තා කළ අතර, දළ නිල සංචිත වැඩි විය...

- **සමස්ත ශේෂය**
  - **2019:** එ.ජ.ඩොලර් මිලියන 377ක අතිරික්තය
  - 2018: එ.ජ.ඩොලර් මිලියන 1,103ක හිඟය
- **දළ නිල සංචිත**
  - **2019:** එ.ජ.ඩොලර් බිලියන 7.6 (ආනයනික මාස 4.6)
  - 2018: එ.ජ.ඩොලර් බිලියන 6.9 (ආනයනික මාස 3.7)

දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **2019 අවසානය වනවිට දළ නිල සංචිත තත්ත්වය වැඩිවීමට හේතු වූයේ;**
  - නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙකක් තුළින් වූ ලැබීම්
  - ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි වාරික දෙකක් ලැබීම
  - දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම

දළ නිල සංචිත

වාර්ෂික වාර්තාව 2019

2019 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල 0.6%කින් අතිප්‍රමාණය විය...

- 2018 වසරේ දී සිදුවූ තියුණු අවප්‍රමාණයෙන් පසුව යම් අස්ථාවරත්වයක් මධ්‍යයේ වුවද, විනිමය අනුපාතිකය 2019 වසරේදී නිවැරදි වීමක් පෙන්නුම් කළේය.
- මහ බැංකුව 2019 වසරේදී දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ පදනම මත එ.ජ.ඩොලර් මිලියන 387 ක් අවශෝෂණය කර ගන්නා ලදී. (2018 : එ.ජ.ඩොලර් බිලියන 1.12 ක ශුද්ධ සැපයුමක්)
- මූර්ත සඵල විනිමය අනුපාතික 2019 වසරේදී ඉහළ ගිය නමුත් එය පදනම් වර්ෂයේ මට්ටමට වඩා පහළ මට්ටමක පැවතුණි.
- කෙසේ වෙතත්, COVID-19 වසංගතය පැතිරීමත් සමඟ විනිමය අනුපාතිකය 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවල සැලකිය යුතු විචලනයක් පෙන්නුම් කළේය.

විනිමය අනුපාතිකයේ වෙනස්වීම්





6 වන පරිච්ඡේදය

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

වාර්ෂික වාර්තාව 2019

I වන වෙළුම

ශ්‍රී ලංකා මහ බැංකුව

2019-2020 කාල පරිච්ඡේදය තුළ දී රජය විසින් අවස්ථා කිහිපයකදීම රාජ්‍ය මූල්‍ය ලිහිල්කරණ ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී...

- **පාස්කු ඉරුදින ප්‍රහාර ප්‍රහාරවලින් ඇති වූ විනාශකාරී බලපෑම් වලට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාත්මක වූ ක්‍රියාමාර්ග**
  - හෝටල් සහ සංචාරක කටයුතු ක්‍රියාකරවන්නන් සඳහා එකතු කළ අගය මත බදු අනුපාතිකය 15% සිට 7% දක්වා අඩු කිරීම
  - ආරක්ෂක උපකරණ ආනයන බද්දෙන් නිදහස් කිරීම

- **වසර ගණනාවක් පුරා අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පවත්වන ආර්ථික වර්ධනයට පිළියම් යෙදීම සඳහා ජනාධිපතිවරණයෙන් පසුව ක්‍රියාත්මක කළ ක්‍රියාමාර්ග**
  - 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම
  - මූල්‍ය සේවා හැර අනෙකුත් අංශ සඳහා එකතු කළ අගය මත බදු පුළුල් පදනමකින් 8% දක්වා අඩු කිරීම
  - ජාතිය ගොඩනැගීමේ බද්ද හා රඳවා ගැනීමේ බද්ද ඉවත් කිරීම
  - රජයේ පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් සීමා කිරීම

- **කොවිඩ්-19 වසංගතයේ පැතිරීමට ප්‍රතිචාර වශයෙන් හඳුන්වා දුන් ක්‍රියාමාර්ග**
  - සෞඛ්‍ය පහසුකම් සඳහා අවශ්‍ය වියදම් ප්‍රතිපාදන සැපයීම
  - අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා උපරිම සිල්ලර මිල ගණන් පැනවීම
  - සමාජ දුරස්ථභාවය පවත්වාගැනීමට අදාළ නියෝග බලපැවැත්වෙන කාලවලදී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා පහසුකම් සැලසීම
  - වසංගතය පැතිර යාම සීමා කිරීම සඳහා අනෙකුත් අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීම
  - අඩු ආදායම්ලාභී සහ ආර්ථික වශයෙන් ශක්තිමත් නොවන අවධානය ලැබිය යුතු පවුල් සහ පුද්ගලයින් සඳහා එකවර ගෙවන දීමනාවක් ලෙස රුපියල් 5,000ක මුදල් ආධාර ලබා දීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

රජයේ ආදායම නාමික වශයෙන් මෙන්ම දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස පහළ ගියේය...

- රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති 13.4% සිට 2019 වසරේ දී 12.6 % දක්වා අඩු විය.
- නාමික වශයෙන් මුළු ආදායම රුපියල් බිලියන 1,890.9 දක්වා 1.5%කින් අඩු විය.
- ආදායම් බදුවලින් ලද ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගිය ද, නිෂ්පාදන/සුරා බදු, එකතු කළ අගය මත බද්ද, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, සෙස් බද්ද සහ වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බදු මගින් ලද ආදායම අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස මුළු ආදායම පහළ ගියේය.

රජයේ ආදායම (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලය: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

රාජ්‍ය ආයෝජන අඩුවුවද, පුනරාවර්තන වියදම් ඉහළ යෑම හේතුවෙන් මුළු වියදම සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙසද ඉහළ ගියේය...

- මුළු වියදම හා ශුද්ධ ණය දීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති 18.7% සිට 2019 වසරේ දී 19.4% දක්වා ඉහළ ගිය අතර, නාමික වශයෙන් මුළු වියදම හා ශුද්ධ ණය දීම් රුපියල් බිලියන 2,915.3ක් දක්වා 8.2%කින් ඉහළ ගියේය.

- පුනරාවර්තන වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති 14.5% සිට 2019 වසරේ දී 15.4% දක්වා ඉහළ ගිය අතර, නාමික වශයෙන් පුනරාවර්තන වියදම රුපියල් බිලියන 2,301.2ක් දක්වා 10.1%කින් ඉහළ ගියේය.
- සහනාධාර හා පැවරුම්, වැටුප් හා වේතන, සහ පොලී ගෙවීම් මත වන වියදම ඉහළ යාම පුනරාවර්තන වියදම ඉහළ යාමට හේතු විය.
- ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් 2018 වසරේ පැවති 4.2% සිට 2019 වසරේ දී 4.1% දක්වා අඩු විය.

රජයේ වියදම (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලය: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

රාජ්‍ය ආදායමේ සැලකිය යුතු අඩුවීම සහ පුනරාවර්තන වියදම් ඉහළ යෑම මධ්‍යයේ 2019 වසරේ දී රාජ්‍ය මූල්‍ය ශේෂයන් පසුබෑමට ලක් විය...

- සමස්ත අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති 5.3% (රුපියල් බිලියන 760.8) සිට 2019 වසරේ දී 6.8% (රුපියල් බිලියන 1,016.5) දක්වා ඉහළ ගියේය.

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලය: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

- වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ වාර්තා වූ 1.2% (රුපියල් බිලියන 169.7) සිට 2019 වසරේ දී 2.7% (රුපියල් බිලියන 410.3) දක්වා ප්‍රසාරණය විය.

- ප්‍රාථමික ශේෂය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ දී වාර්තා කළ 0.6% (රුපියල් බිලියන 91.4)ක අතිරික්ත ශේෂයට සාපේක්ෂව 2019 වසරේ දී 0.8% (රුපියල් බිලියන 115.1)ක හිඟයක් බවට පත් විය.

2019 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීමේදී රජය වැඩි වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතුණි...

- සමස්ත මූල්‍ය අවශ්‍යතාවයෙන් ශුද්ධ දේශීය මූල්‍යනය 2018 වසරේ පැවති 57.5% (රුපියල් බිලියන 437.2) සමඟ සැසඳීමේදී 2019 වසරේ දී 69.1% (රුපියල් බිලියන 702.4)ක් විය.
  - බැංකු නොවන අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය රුපියල් බිලියන 509.3 දක්වා සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, එය සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසරේ පැවති 75.0% (රුපියල් බිලියන 327.8)ට සාපේක්ෂව 2019 වසරේ දී 72.5% ක් විය.
  - බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය 2019 වසරේ දී රුපියල් බිලියන 193.1ක් වූ අතර එය සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනයෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට 27.5% ක් විය.
- විදේශීය මූලාශ්‍ර මඟින් සිදුකළ ශුද්ධ මූල්‍යනය 2018 වසරේ පැවැති 42.5% (රුපියල් බිලියන 323.5) සිට 2019 වසරේ දී 30.9% (රුපියල් බිලියන 314.1) දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

අයවැය හිඟය මූල්‍යනය (ශුද්ධ)
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලය: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

ඉහළ ගිය අය වැය හිඟය පියවා ගැනීම සඳහා වූ ශුද්ධ ණය ගැනීම වැඩි වීමෙහි සහ සාපේක්ෂව පහළ මට්ටමක පැවති නාමික ද.දේ.නි.යෙහි බලපෑම පිළිබිඹු කෙරෙමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය ඉහළ ගියේය...

මධ්‍යම රජයේ නොපිය වූ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලාශ්‍රය: මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

- මධ්‍යම රජයේ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2018 වසර අවසානයට පැවති 83.7% සිට 2019 වසර අවසානයේ දී 86.8% දක්වා ඉහළ ගියේය.
  - දේශීය හා විදේශීය ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 2018 වසර අවසාන වන විට පැවති 42.2% සහ 41.5% සිට 2019 වසර අවසාන වන විට 44.1% සහ 42.6% දක්වා වැඩි විය.
- නාමික වශයෙන් මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2019 වසර අවසාන වනවිට රුපියල් බිලියන 13,031.5ක් දක්වා 8.3% (රුපියල් බිලියන 1,001) කින් වැඩිවිය.

7 වන පරිච්ඡේදය

මුදල් ප්‍රතිපත්තිය, මුදල්, ණය සහ පොලී අනුපාතික



පහළ මට්ටමක පවතින ආර්ථික ක්‍රියාකාරකම් යළි නඟා සිටුවීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2019 මැයි මාසයේදී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් ක්‍රියාවට නැංවූ අතර, එය 2019 අගෝස්තු මාසයේදී සහ 2020 මුල් කාලය තුළදී තවදුරටත් ලිහිල් කරන ලදී...

- **පහළ උද්ධමනය, මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා, සාපේක්ෂ වශයෙන් ස්ථාවර විදේශීය අංශය සහ වඩාත් ලිහිල් වූ ගෝලීය මුදල් ප්‍රතිපත්ති යනාදියෙහි සහාය ලබමින්**

- **කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ ආර්ථික කටයුතුවලට සහය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 මාර්තු සහ අප්‍රේල් මාසවලදී මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කළේය.**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 මාර්තු සිට 2020 අප්‍රේල් මුල් කාලය දක්වා ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 200කින් සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.0කින් අඩු කරන ලදී.

- *උද්ධමනය මැදි කාලීනව මැදි තනි අගයක මට්ටමේ ස්ථාවරව පවත්වා ගැනීම සහ එමගින් ආර්ථික වර්ධනය එහි විභව මට්ටමට ළඟාවීමට සහය වීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය නම්‍යශීලි උද්ධමන ඉලක්කකරණ රාමුවකට අනුකූලව ක්‍රියාත්මක කළේය*

ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කළද, වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑමේ ඉතා මන්දගාමී තත්ත්වයක් පෙන්නුම් කළ බැවින් මහ බැංකුව පොලී අනුපාතික මත උපරිම සීමා පැනවීය...

- අරමුදල්වල පිරිවැය අඩු කිරීම සඳහා මහ බැංකුව 2019 අප්‍රේල් මාසයේදී තැන්පතු අනුපාතික මත උපරිම පොලී අනුපාතික සීමා පැනවූ අතර, දේශීය මුදල් වෙළඳපොළේ ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වාගෙන ගියේය.
- එහෙත්, ණය පොලී අනුපාතික පහළ යෑම ඉතා මන්දගාමී තත්වයක් පෙන්නුම් කල බැවින් තාවකාලික පියවරක් ලෙස මහ බැංකුව විසින් 2019 සැප්තැම්බර් මාසයේදී බලපත්‍රලාභී බැංකුවල ණය අනුපාතික මත උපරිම පොලී අනුපාතික සීමා පැනවූ අතර තැන්පතු අනුපාතික මත වූ උපරිම සීමා ඉවත් කරන ලදී.
- එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපල ණය අනුපාතික ක්‍රමිකව පහළ යෑම ආරම්භ විය.
- 2019 වසර තුළදී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස අඩු විය.

දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ ද්‍රවශීලතා කළමනාකරණය



වාණිජ බැංකු ණය සහ තැන්පතු අනුපාතික



භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික



2019 වසර තුළ දී මුදල් සමස්තවල මන්දගාමීවීමක්...

- 2019 මාර්තු මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ප්‍රතිශතාංක 1.00කින් අඩුකිරීමෙහි බලපෑම පිළිබිඹු කෙරෙමින්, 2019 වසර තුළ දී සංචිත මුදල් පහළ යෑමක් වාර්තා කළේය.
- බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම්හි අඩු වර්ධනය හේතුවෙන් 2019 වසර තුළ දී පුළුල් මුදල් **(M2b)** වර්ධනය අඛණ්ඩව මන්දගාමී විය.
    - පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශය සඳහාම ලබා දුන් ණය මන්දගාමී වීම හේතුවෙන් වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම මන්දගාමී විය.
    - 2019 වසර තුළ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ ගියේය.

මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය



දේශීය ණයෙහි වාර්ෂික ඉහළ යෑම



2018 වසර හා සැසඳීමේ දී බැංකු අංශය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2019 වසර තුළ දී මන්දගාමීව වුව ද, අඛණ්ඩව ඉහළ ගියේය...

- බැංකු පද්ධතිය විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය 2018 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 348.2ක ඉහළ යෑම හා සැසඳීමේදී 2019 වසර තුළ දී රුපියල් බිලියන 250.4කින් ඉහළ ගියේය.

- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජයට සපයන ලද ශුද්ධ ණය ඉහළ ගියේය.
  - වාණිජ බැංකු වෙතැති රජයේ නොපිය වූ බැංකු අයිරා ශේෂය වසර තුළ දී පහළ ගියද, රජයේ සුරැකුම්පත් මත වූ ආයෝජන ඉහළ යෑම මේ සඳහා හේතු විය.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය පහළ ගියේය.
  - මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීමත් සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිවිකුණුම් ගනුදෙනු පහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය පහළ යෑම මේ සඳහා හේතු විය.

ශ්‍රී ලංකා මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය සහ රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම්



රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් බැංකු අංශයෙන් ලබා ගන්නා ලද ණය ද, 2018 වසරට සාපේක්ෂව 2019 වසරේ දී අඩු වේගයකින් වර්ධනය විය...

- 2018දී වාර්තා වූ රු. බිලියන 218.4 ක වර්ධනයට සාපේක්ෂව, 2019දී රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් මගින් ලබා ගන්නා ලද ණය රු. බිලියන 62.6ක වර්ධනයක් වාර්තා කළ අතර, එමගින් 2019 අවසානය වන විට රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් බහුතරයක පිරිහුණු මූල්‍ය තත්ත්වය අර්ධ වශයෙන් පිළිබිඹු කෙරෙයි.
  - දුර්වල මූල්‍ය කාර්ය සාධනය පිළිබිඹු කරමින්, මාර්ග සංවර්ධන අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මගින් ලබා ගන්නා ලද ණය වසර තුළදී ඉහළ ගියේය.
  - කෙසේ වුවද, වසර තුළදී සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලංකා පොහොර සමාගම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සිය වගකීම් රු. බිලියන 5.7කින් ආපසු ගෙවන ලදී.

ප්‍රධාන රාජ්‍ය සංස්ථා විසින් ලබා ගත් ණය - 2019 (රු. මිලියන)

රාජ්‍ය සංස්ථාව	දෙසැ-18	දෙසැ-19	වෙනස (දෙසැ-19/දෙසැ-18)
මුළු වටිනාකම	**755,380**	**817,953**	**62,574**
එයින්,			
මාර්ග සංවර්ධන අධිකාරිය	139,666	167,571	27,905
ලංකා විදුලිබල මණ්ඩලය	67,265	88,249	20,983
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	293,231	307,676	14,445
ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	64,949	73,450	8,502
රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	1,882	3,670	1,788
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව	8,959	7,035	(1,924)
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	12,803	10,919	(1,884)
ලංකා පොහොර සමාගම	15,086	13,203	(1,883)

වසර තුළ පැවති මන්දගාමී ආර්ථික කටයුතු සහ 2019 වසර මුල් අවධියේ පැවති දුර්වල ආයෝජක විශ්වාසය පිළිබිඹු කෙරෙමින්, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි වර්ධනය 2019 වසර තුළ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය...

- 2009 වසරෙන් පසුව වාර්තා වූ අඩුම වාර්ෂික වර්ධනය වාර්තා කරමින්, 2019 වසර අවසානයේදී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණයෙහි වර්ධනය සියයට 4.3 දක්වා මන්දගාමී විය.
- කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ගවල සහාය ඇතිව ණය ලබා දීමේ යම් යථා තත්ත්වයකට පත්වීමක් 2019 වසරේ අවසාන කාලය තුළදී දක්නට ලැබුණි.
- 2019 වසර තුළදී සියලුම ප්‍රධාන ආර්ථික අංශ සඳහා සපයන ලද ණය වර්ධනය අඛණ්ඩව මන්දගාමී විය.
  - කෘෂිකාර්මික අංශය සඳහා සපයන ලද ණය වර්ධනය 2018 වසර අවසානයේ පැවති සියයට 14.0ක වර්ධනය හා සැසඳීමේදී 2019 වසර අවසානයේදී සියයට 0.2 දක්වා සැලකිය යුතු ලෙස මන්දගාමී විය.
  - කර්මාන්ත අංශයට සපයන ලද ණය වර්ධනය 2018 වසර අවසානයේ පැවති සියයට 15.3 සිට 2019 වසර අවසානයේදී සියයට 3.1ක් දක්වා මන්දගාමී විය.
  - සේවා අංශය සඳහා සපයන ලද ණය වර්ධනය 2018 වසර අවසානයේ පැවති සියයට 17.8ක වර්ධනය හා සැසඳීමේදී 2019 වසර අවසානයේදී සියයට 3.1 දක්වා මන්දගාමී විය.
  - 2019 වසරේ පළමු භාගය තුළදී සියයට 20කට වඩා වර්ධනය වූ පෞද්ගලික ණය සහ අත්තිකාරම්, 2018 වසර අවසානයේදී වූ සියයට 20.3ක වර්ධනය හා සැසඳීමේදී 2019 වසර අවසානයේදී සියයට 11.9ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය.

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය



ප්‍රධාන අංශවලට ලබාදුන් පෞද්ගලික අංශයේ ණයවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%)



8 වන පරිච්ඡේදය

මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව

වාර්ෂික වාර්තාව 2019

I වන වෙළුම

ශ්‍රී ලංකා මහ බැංකුව

2019 වසරේ දී බැංකු අංශය අඩු වේගයකින් වර්ධනය විය...

- බැංකු අංශයේ වත්කම්වල අඩු වර්ධනය, ණය සඳහා ඇති අඩු ඉල්ලුමේ ප්‍රතිඵලයක් වන අතර, අක්‍රීය ණය වැඩිවීම හේතුවෙන් බැංකු විසින් ණය පරීක්ෂාව දැඩි කරන ලදී.
- වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම, මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම සහ බදු වැඩිවීම හේතුවෙන් බැංකු අංශයේ ලාභදායීත්වය සැලකිය යුතු ලෙස පහත වැටුණි.
- බැංකු පද්ධතිය ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව නියමිත අවම අවශ්‍යතාවන්ට වඩා ඉහළ අගයක පවත්වා ගනිමින් එම අංශයේ ස්ථාවරත්වය පෙන්නුම් කළේය.

බැංකු අංශයේ ලාභදායිත්ව දර්ශක



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව



2019 වසරේ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය පිරිහීමට ලක්විය...

- සෘණාත්මක ණය වර්ධනය, ලාභදායීත්වය පහළ යෑම සහ අක්‍රීය ණය වැඩි වීම සමඟ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය පහළ ගියේය.
- ප්‍රධාන වශයෙන් පොලී නොවන වියදම් සහ අක්‍රීය ණය සඳහා වෙන්කිරීම් ඉහළ යෑම හේතුවෙන් 2019 වසර තුළදී මෙම අංශයේ ලාභදායීත්වය සැලකිය යුතු ලෙස පහත වැටුණි.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ලාභදායිත්ව දර්ශක



- පාස්කු ඉරු දින ප්‍රහාරයේ ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික කටයුතු මන්දගාමී වීම ණය ලබා දීමේ කටයුතු අඩුවීම සහ ණය සහන ලබා දීමේ වැඩසටහනවල පසු බලපෑම මධ්‍යයේ අක්‍රීය ණය අනුපාතය ඉහළ ගියේය.
- ද්‍රවශීලතා වත්කම් ප්‍රමාණය අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ අගයක පවත්වා ගනිමින් ප්‍රාග්ධනය යහපත් මට්ටමක පවත්වා ගැනීමත් සමඟ සමස්තයක් ලෙස මෙම අංශය ස්ථාවරව පැවැතුණි.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්



2019 වසර තුළ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව මිශ්‍ර වර්ධනයක් පෙන්වීය...

- 2019 වසර තුළ දී සමස්ත කොටස් මිල දර්ශකය, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය, මිල ඉපැයුම් අනුපාතය සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය අනුව කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව වර්ධනයක් පෙන්නුම් කළද, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය පහත වැටුණි.
- 2018 වසරට සාපේක්ෂව අඩු වේගයකින් වුවද, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙන් විදේශ විනිමය අඛණ්ඩව ගලා යෑම සිදු විය.
  - කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ ද්විතීයික වෙළඳපොළ තුළ ශුද්ධ විදේශ විනිමය ගලා යෑම් රුපියල් බිලියන 11.7කි. (2018: ශුද්ධ විදේශ යෑම් රුපියල් බිලියන 23.2ක් විය)

කොළඹ කොටස් වෙළඳපොළ සමස්ත කොටස් මිල දර්ශකය, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සහ දෛනික පිරිවැටුම



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

මැදි කාලීන පුරෝකථන, ගැටලු සහ අභියෝග

වාර්ෂික වාර්තාව 2019

I වන වෙළුම

ශ්‍රී ලංකා මහ බැංකුව

මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

දර්ශකය	ඒකකය	2018 (ආ)	2019 (ඇ)	පුරෝකථන				
				2020	2021	2022	2023	2024
මූර්ත අංශය (ඈ)								
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	3.3 (ඇ)	2.3	1.5	4.5	6.0	6.2	6.5
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	14,366 (ඇ)	15,016	15,925	17,466	19,443	21,690	24,245
ඒක පුද්ගල ද.දේ.නි.	එ.ජ. ඩොලර්	4,079 (ඇ)(ඉ)	3,852	3,940	4,166	4,473	4,813	5,190
මුළු ආයෝජන	ද.දේ.නි.යේ % වශයෙන්	30.4 (ඇ)(ඊ)	27.4	26.8	27.3	27.8	28.1	28.4
දේශීය ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	23.0 (ඇ)(ඊ)	21.3	20.7	21.3	22.5	23.6	24.5
ජාතික ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	27.3 (ඇ)(ඊ)	25.3	23.7	24.7	25.6	26.2	26.8
විදේශීය අංශය								
වෙළඳ පරතරය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-11.7	-9.5	-7.7	-9.8	-9.7	-9.5	-9.2
අපනයන	එ.ජ. ඩොලර් මිලියන	11,890	11,940	8,740	11,117	12,421	13,594	15,380
ආනයන	එ.ජ. ඩොලර් මිලියන	22,233	19,937	15,415	20,135	22,092	23,815	26,135
ජංගම ගිණුමේ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-3.2	-2.2	-3.1	-2.6	-2.2	-1.9	-1.6
විදේශීය නිල සංචිත	ආනයනික මාස වශයෙන්	3.7	4.6	5.6	4.6	4.6	4.6	4.6
රාජ්‍ය මූල්‍ය අංශය (ඈ)								
සමස්ත ආදායම් සහ ප්‍රදාන	ද.දේ.නි.යේ % වශයෙන්	13.5 (උ)	12.6	9.8	11.8	13.5	14.1	14.5
වියදම හා ශුද්ධ ණය දීම්	ද.දේ.නි.යේ % වශයෙන්	18.7 (උ)	19.4	17.7	18.6	19.1	19.2	19.4
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-1.2 (උ)	-2.7	-5.1	-3.6	-2.1	-1.5	-1.0
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	0.6 (උ)	-0.8	-2.8	-1.0	0.5	0.7	1.1
සමස්ත අයවැය හිඟය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.3 (උ)	-6.8	-7.9	-6.8	-5.6	-5.2	-4.9
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	83.7 (උ)	86.8	92.4	89.4	84.3	80.5	76.3
මුදල් අංශය සහ උද්ධමනය								
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඌ)	සියයට	13.0	7.0	9.3	12.9	12.7	12.5	12.5
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඌ)	සියයට	15.9	4.3	4.0	10.0	12.2	13.0	13.0
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (එ)	සියයට	4.3	4.3	4.5	5.0	5.0	5.0	5.0

(අ) 2020 මාර්තු මස අවසානය වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2018 වසර සඳහා ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින්, 28.6%, 21.2% සහ 25.4% ක් වූ මුළු ආයෝජන, දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 මාර්තු 31 දින නිකුත් කරන ලද 2018 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඌ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

ගැටලු සහ අභියෝග...

1. **විදේශීය ණය සේවා සේවාකරණ ගෙවීම් වැඩිවීම** ශ්‍රී ලංකාවේ මැදිකාලීන සාර්ව ආර්ථික ස්ථාවරත්වයට අවදානමක් ඇති කළ හැකි අතර, එම නිසා රටේ විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීම සඳහා පියවර ගැනීමට අවශ්‍යව ඇත.

2. කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් නුදුරු අනාගතයේදී රාජ්‍ය මූල්‍ය ඊට අදාළ ඉලක්ක වෙතින් බැහැර වීම නොවැළැක්විය හැකි බැවින් මැදි කාලීනව **රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව** ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වන අතර අපේක්ෂිත ආර්ථික සහභාගිකරුවන් වෙත ප්‍රතිලාභ කාර්යක්ෂම සහ ඵලදායි ලෙස සම්ප්‍රේෂණය වීමේ අවශ්‍යතාවය ද අවධාරණය කරනු ලබයි.

3. ප්‍රාථමික අපනයන වෙළෙඳ භාණ්ඩ මිල ගණන් වල සිදුවන සැලකිය යුතු උච්චාවචනය මධ්‍යයේ අපනයන අංශය තුළ ලංකාවේ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා දේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සහ **කලාපීය හා ගෝලීය අගයදාමය තුළ ලංකාවේ සහභාගිත්වය** ඉහළ නැංවීම අතිශයින් වැදගත් වේ.

4. පාස්කු ඉරුදින ප්‍රහාර සහ කොවිඩ්-19 වසංගතයෙන් ඇතිවූ පසුබෑමෙන් පරිබාහිරව, මැදි කාලීනව **ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය** ප්‍රවර්ධනය කිරීම හා තිරසාරව පවත්වාගෙන යෑම සඳහා **නවීන තාක්ෂණය** භාවිත කළ යුතුව ඇත.

ගැටලු සහ අභියෝග...

5. ශ්‍රී ලංකාවේ වර්ධන ශක්‍යතා ඉහළ නැංවීම සඳහා රටේ තරගකාරීත්වය වැඩිදියුණු කිරීමත්, **ජාතික ප්‍රතිපත්තිවල අඛණ්ඩතාව සහතික කිරීමත්** පිළිබඳව අවධානය යොමු කරමින් **පුළුල් ජාතික කාර්මික ප්‍රතිපත්තියක්** ක්‍රියාත්මක කිරීම අත්‍යවශය වේ.

6. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන අංශය අඩු ඵලදායීතාව නිසා බලපෑමට ලක්ව ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම අංශයේ දක්නට ලැබෙන මන්දගාමී වර්ධනය සහ **ගෝලීය වෙළඳපොල තුළ ශ්‍රී ලංකාවේ අපනයනවල අඩු තරඟකාරීත්වය** තුළින් ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු තුළින් ඵලදායීතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

7 ශ්‍රී ලංකාව පසුගිය කාලයේ දී සමාජයීය හා මානව ප්‍රාග්ධන සංවර්ධන අංශවල ඉලක්ක සපුරා ගත්ත ද, ආර්ථිකයේ ආදායම් තත්ත්වය ඉහළ යෑමත් සමඟ නව අභියෝග රැසක් මතුව ඇති අතර **ඉහළ හා තිරසාර වර්ධනයක් සඳහා පහසුකම් සැලසීමට ශ්‍රම බලකාය ප්‍රමාණවත් තරම් සුදුසුකම් සපුරා ඇත්දැයි තක්සේරු කිරීම** අවශ්‍ය වේ.

8. **කෘෂිකාර්මික නිෂ්පාදිත සඳහා ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම** සහ කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ සඳහා මූල්‍යන විකල්ප නොමැතිවීම හේතුවෙන් ආහාර මිලෙහි තියුණු උච්චාවචන සිදු වීම සහ නිෂ්පාදකයින්ට ලැබෙන ගොවිපොළ මිල ගණන් පහළ මට්ටමක පවතී.

ගැටලු සහ අභියෝග...

9. වේගවත් සහ සැමට ප්‍රතිලාභ ලබා දෙන ආර්ථික වර්ධනයක් සහතික කිරීම සඳහා යටිතල පහසුකම් වැදගත් වුව ද, එවැනි **බොහෝ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය මෑත වසරවල දී මන්දගාමී** වී ඇති බැවින් එම ව්‍යාපෘතිවල ඍණ බාහිරතා පිළිබඳව ද සලකා බලමින් ඒ සඳහා **පුද්ගලික අංශයේ මැදිහත්වීම** ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ.

10. බලශක්ති උත්පාදන සංයුතිය පිළිබඳ ස්ථාවර ප්‍රතිපත්තියක් තුළින් **බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරීම** සහ දිගු කාලීන උත්පාදන විකාශ සැලැස්ම කාලෝචිතව ක්‍රියාත්මක කිරීම ආර්ථික වර්ධනය තිරසාරව පවත්වා ගෙන යන අතර ආර්ථිකය මත පවතින මූල්‍යමය බර අඩු කිරීම සඳහා ද ඉතා වැදගත් වේ.

11. විශාල වශයෙන් රජයේ මුල්‍ය සහාය මත රඳා පවත්නා දුර්වල කර්යසාධනයක් පිළිබිඹු කරන රජය සතු වාණිජ ව්‍යවසායයන් අඛණ්ඩව ජාතික පිරිවැය මත පීඩනයක් ඇති කරන හෙයින්, එවැනි රජය සතු වාණිජ ව්‍යවසායයන්වල ප්‍රතිසංස්කරණ සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

12. අක්‍රමවත් කාලගුණික රටා සහ ඉහළ යමින් පවතින ජල ඉල්ලුම මධ්‍යයේ, **ජල සුරක්ෂිතතාව** ශ්‍රී ලංකාව තුළ බරපතල ගැටලුවක් බවට පත්ව ඇති අතර, උස්සාන වාරි සැපයුම් පද්ධති සහ වැසි ජලය රැස් කිරීමේ ක්‍රම ඇතුළු **වැඩි දියුණු කළ ජල කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කඩිනම් අවශ්‍යතාවක්ව** පවතී.

ගැටලු සහ අභියෝග...

13. රජයේ අයවැය මත සැලකිය යුතු පීඩනයක් ඇති කරමින් **ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස මගින් පැන නඟින අවදානම්වලට ශීඝ්‍රයෙන් භාජනය වෙමින් පවතින** අතර, එම ගැටලු සඳහා විසඳුම් ලෙස **පාරිසරික බදු ප්‍රතිසංස්කරණ** සහ **හරිත මූල්‍යයන ක්‍රමවේදයන්** වැනි ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍යව ඇත.

14. **සැපයුම් අංශයේ නිරන්තරයෙන් ඇතිවන අවහිරතා හේතුවෙන් පැන නඟින මිල පීඩන** මගින් අඩු සහ ස්ථාවර උද්ධමනයක් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දරන උත්සාහයට බාධා ඇති කළ හැකි අතර, ආහාර උද්ධමනය පාලනය සඳහා මුදල් ප්‍රතිපත්තිය හොඳ උපකරණයක් නොවන හෙයින් ආහාර උද්ධමනය පාලනය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ සහාය අවශ්‍ය වේ. .

15. **මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලියෙහි පවතින අනිසි ප්‍රමාද** මගින් මූර්ත ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සම්ප්‍රේෂණය වීමේ කාර්යක්ෂමතාවයට බාධා පමුණුවයි.

16. ශ්‍රී ලංකාව **අඩු පොලී අනුපාතික ව්‍යුහයක්** කරා යොමු වීමත් සමඟ, ඉතිරි කරන්නන්ගේ, විශේෂයෙන්ම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ, ජීවත තත්ත්වය සහතික කිරීම සඳහා **සාධාරණ ප්‍රතිලාභයක් සහිත නව මූල්‍ය නිෂ්පාදන හඳුන්වාදීම** අත්‍යවශ්‍ය වේ.

17. ආර්ථික වර්ධනයට පහසුකම් සැලසීම සඳහා මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහ එහි ශක්‍යතාව ඉහළ නැංවීම වෙනුවෙන් **මූල්‍ය අංශයේ ඒකාබද්ධ කිරීම්** ප්‍රවර්ධනය කිරීම සඳහා පූර්වෝපායී සහ කාලෝචිත ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

ගැටලු සහ අභියෝග...

18. ‘නව කොළඹ’ සංවර්ධනයත් සමඟ ගෝලීය මූල්‍ය කේන්ද්‍රස්ථානයක් වීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරන හෙයින්, **මූල්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ එම අංශය පුළුල් කිරීම** අත්‍යවශ්‍ය වේ.

19. ශ්‍රී ලංකාව ලෝකයේ සෙසු රටවල් සමඟ පුද්ගල සහ භාණ්ඩ සංචලනය ඔස්සේ වැඩි වශයෙන් සම්බන්ධ වෙමින් පවතින තත්ත්වයන් තුළ කොවිඩ්-19 වසංගතයේ ශීඝ්‍ර පැතිර යෑමෙන්ද පැහැදිලි වන පරිදි **ආවේක්ෂණ සහ නිරෝධායන කටයුතු සඳහා ශක්තිමත් ප්‍රතිපත්ති රාමුවක් ක්‍රියාත්මක කිරීම** අත්‍යවශ්‍ය වේ.

20. කොවිඩ්-19 වසංගතය පැතිරීම හා වෙනත් හදිසි අවස්ථා වැනි උපද්‍රවයන්ගෙන් පැන නගින සමාජ-ආර්ථික බලපෑම් විසඳීම සඳහා **ආපදා කළමනාකරණ සැලසුම් සහ සමාජ ආරක්ෂණ වැඩසටහන් සවිමත් කිරීමේ වැදගත්කම** අවධාරණය කරයි.

21. කොවිඩ්-19 වසංගතය සහ ඉක්බිතිව ඇති වූ ගෝලීය ප්‍රතිචාර මගින්, අතීතයේදී අර්බුදකාරී අවස්ථාවල යොදා ගන්නා ලද ප්‍රතිපත්ති ප්‍රතිචාරවලට වඩා සැලකිය යුතු ලෙස වෙනස් ප්‍රතිපත්ති ප්‍රතිචාර අවශ්‍ය වන, ගැටලුකාරී තත්ත්ව කිහිපයක් ඉස්මතු කර දී ඇත.

- වසංගතයේ බහුවිධ බලපෑම්වලට මුහුණ දීම සඳහා බොහෝ රටවල් කෙටි කාලීනව ආරක්ෂණවාදී පියවර අනුගමනය කළ හැකි වුවද, දිගු කාලීනව වෙනස් ස්වරූපයකින් වුවද, සියලු රටවල් ගෝලීයකරණය නැවත වැළඳගනු ඇත.

විශේෂ සටහන්



B2: කොවිඩ්-19 සහ ශ්‍රී ලංකාව: අභියෝග, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ ඉදිරි දැක්ම

- 2019 වසර අවසානයේ දී චීනයේ ප්‍රථම වරට අනාවරණය වූ කොවිඩ්-19 වෛරසය ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත වූ අතර ලෝක සෞඛ්‍ය සංවිධානයට එය වසංගත තත්ත්වයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට සිදුවිය.
- ශ්‍රී ලංකාව මේ වන විට වෛරසයේ ව්‍යාප්තිය පාලනය කිරීම සම්බන්ධව යම් සාර්ථකත්වයක් ලබා ඇති අතර, වෛරසය හේතුවෙන් වසර තුළදී ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති වනු ඇත.

ශ්‍රී ලංකාවේ ආර්ථික බලපෑම

- දේශීය වශයෙන් වෛරසය පාලනය කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රධාන ආර්ථික අංශ කිහිපයකට බලපානු ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ වර්ධන වේගය පහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර එය රටේ අපනයනය කෙරෙහි බලපානු ඇත.
- වර්තමාන වසංගත තත්ත්වය දිගු කල් පවතින්නේ නම් එය සංචාරක කර්මාන්තයට අහිතකර ලෙස බලපානු ඇත.
- මැද පෙරදිග, යුරෝපා සංගමය සහ ඈත පෙරදිග ආසියාව වෙතින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වලට ඇඩි ලෙස බලපානු ඇත.
- විදේශීය සෘජු ආයෝජන මෙන්ම ණය ඉහළ නැංවීමේ පිරිවැය කෙරෙහි වසංගත ව්‍යාප්තිය ආශ්‍රිතව පවතින අවිනිශ්චිතභාවය හේතුවෙන් වන බලපෑම්
- වසංගත ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මූල්‍ය සම්පත් යෙදවීම මගින් ආර්ථික ප්‍රගතිය මන්දගාමී වනු ඇත

ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම

මුදල් සහ මූල්‍ය අංශයේ ක්‍රියාමාර්ග	රට තුළට ප්‍රවේශවීම පාලනය කිරීම සහ සෞඛ්‍ය අංශයේ ප්‍රතිපත්ති	රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග

COVID-19



- ප්‍රතිපත්ති අනුපාතික, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ බැංකු අනුපාතික පහළ දමන ලදී.
- *විවිධ අංශ සඳහා ණය ආපසු පියවීමේ සහන කාලයක් ලබාදීම*
- *සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද පහසුකම (Saubagya COVID-19 Renaissance Facility) සහ නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (New Comprehensive Rural Credit Scheme)*
- අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීම
- ප්‍රාග්ධන ගලා යෑම සඳහා තාවකාලික සීමා පැනවීම

- *සංචාරක, ඇඟලුම් සහ තොග හා සිල්ලර වෙළඳ අංශවල නියැලී සිටින ව්‍යාපාර සඳහා විවිධ සහන*
- *තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා උපරිම සිල්ලර මිල ගණන හඳුන්වා දීම*
- *අඩු ආදායම් පවුල් සඳහා එකවර ගෙවීමක් ලෙස ලබාදෙන රු.5,000 ක දීමනාව*
- *හිඟ වාරික පියවීම සඳහා අරමුදල් වෙන් කිරීම*
- ඉන්ධන ◌ිල ස්ථායීකරණ අරමුදල පිහිටුවීම
- එකතු කළ අගය මත බදු (VAT) ගෙවීමේදී සහන කාලයක් ලබාදීම

ශ්‍රී ලංකාවේ දේශීය ඉල්ලුම සමස්ත ඉල්ලුමේ සැලකිය යුතු ප්‍රමාණයක් නියෝජනය කරන බැවින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට රැගෙන ඒමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තුළින් ශ්‍රී ලංකාව මෙම තත්ත්වයෙන් මිදී යථා තත්ත්වයට පැමිණීම ඉක්මන් වනු ඇත.

B3: ශ්‍රී ලංකාවේ ආර්ථික උඩ්ඩයනය (Takeoff) - අවශ්‍යතාව සහ සූදානම

- 2009 දී අභ්‍යන්තර යුධමය වාතාවරණය අවසන් වීමත් සමඟ ශ්‍රී ලංකාව ස්ථාවර ප්‍රගතියක් අත්කර ගනිමින් ඉන්පසු වසර තුනක් තුළ සියයට 8ට වඩා ඉහළ වර්ධනයක් වාර්තා කළේය
  - කෙසේ වෙතත්, පසුගිය වසරවල ආර්ථික වර්ධන වේගය අඩුවීම මධ්‍යයේ එහි ප්‍රගතිය මන්දගාමී විය

ගැටලු සහ අභියෝග	ප්‍රතිපත්ති
• *නිවැරදි ලෙස කළමනාකරණය නොවූ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කටයුතු* • *අඩු අපනයන කාර්යසාධනය සහ විදේශීය සෘජු ආයෝජන* • *අඩු කාන්තා ශ්‍රම සහභාගීත්වය සහ අඩු පුහුණු ශ්‍රමය* • *සහාය නොදක්වන නීතිමය රාමු* • *වයස්ගත ජනගහනය* • *දේශපාලන අස්ථාවරත්වය සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව*	• රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සහ අනෙකුත් ප්‍රතිසංස්කරණ • අපනයන නිෂ්පාදන හා වෙළඳපළ විවිධාංගීකරණය කිරීම • බහුපාර්ශ්විය උපායමාර්ගික ආර්ථික හවුල්කාරිත්වය • නෛතික, ආයතනික හා ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ • උසස් නිපුණතා අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීම • තෘතියික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය පුළුල් කිරීම • වැඩිදියුණු කළ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සඳහා අවශ්‍යතාවය • නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම • උසස් යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම (උදා: විදුලි සන්දේශ සහ පුළුල් පරාස අන්තර්ජාල පහසුකම්) • ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම සහ ව්‍යාපාර කිරීම ප්‍රවර්ධනය කිරීම • ජාතික ප්‍රතිපත්ති සහ දිගු කාලීන ආර්ථික අරමුණු පිළිබඳ සම්මුතියක අවශ්‍යතාව

"මැදි අදායම් උගුල" මග හැරීමට සහ සැමට සමානව ප්‍රතිලාභ ලැබෙන තිරසාර වර්ධනයක් සහිත ඉහළ ආදායම් කාණ්ඩයේ ජාතියක් බවට පත්වීමට උඩ්ඩයනය වීම සඳහා සුදුසු ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම අත්‍යාවශ්‍ය වේ

ස්තුතියි

1950-2020 Stability
Sustainability
Shared Prosperity